සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/14/1/3/02

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2016/12/06

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් ,
දිස්ත්‍රික් ප්‍රධාන ගණකාධිකාරීවරුන්/දිස්ත්‍රික් දිවිනැගුම ගණකාධිකාරීවරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

## සමාජ ආරක්ෂණ අරමුදලේ ගිණුම් විගණනය කිරීම
## 2013.01.01 දින සිට 2015.12.31 දක්වා

සමාජ ආරක්ෂණ අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පසුගිය වර්ෂ තුනක කාලයක් සඳහා පිලියෙල කර ඇති අවසන් ගිණුම් ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් විගණනය කිරීම සඳහා 2016.11.03 දින සිට විධිමත් ගිවිසුම් ප්‍රකාර අර්නස්ට් ඇන්ඩ් යන්ග් සමාගම වෙත භාර දී ඇත.

02. ඒ අනුව ඉහත කාර්යය තෝරාගත් විගණන සමාගමට ගිවිසගත් කාල සීමාව තුල නිම කිරීම සඳහා අවශ්‍ය වන සහයෝගය පහත පරිදි ලබාදීමට කටයුතු කිරීම සඳහා අදාල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන්නේ නම් මැනවි.

(අ) විගණනයට ලක්වන කාලපරිච්ඡේද සඳහා ( 2013,2014,2015) පිලියෙල කර ඇති අවසන් ගිණුම් සියළුම උපලේඛණ සමග ලබා දීම, ලැබීම් ගෙවීම් වවුචර් ඇතුළු සියළු පොත්පත්, ලේඛණ සහ ගෙවීම් සනාථ ලියවිලි විගණන අවශ්‍යතාවයන් සඳහා ප්‍රමාදයකින් තොරව ලබා දීම.

(ආ) ඉල්ලුම් කරනු ලබන තොරතුරු සඳහා පැහැදිලි කිරීම් සහ අවශ්‍ය අවස්ථාවලදී ලිඛිත සනාථ ලබා දීම.

(ඇ) එක් කාර්යාලයක විගණන කටයුතු සීමිත දින ගණනක් තුල නිම කිරීමට විගණන සමාගම සැලසුම් කර ඇති බැවින් එම කාල සීමාව තුල අදාල නිලධාරීන් කාර්යාලයේ රැදී සිටීම.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
Tel:011-2873802/2872202
Fax -011-2889002
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General
011-2871672
011-2871672
adg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය / அலுவலகம் / Office
011-2887280
**011- 2887722**(Hotline)

03. ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා විගණන ආයතනය එක් එක් දිස්ත්‍රික්කය වෙත අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලයේ නාම ලේඛණයක් ඔවුන්ගේ හැදුනුම්පත් අංක සමග මෙම ලිපියට අමුණා ඇති අතර, එම නම් සඳහන් අයගේ අනන්‍යයතාවය ජාතික හැදුනුම්පත පරික්ෂාවෙන් අනතුරුව, තහවුරු කර ගැනීමට කටයුතු කල යුතුය.

04. ඉහත කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමු කර අදාල කාර්යය නිවැරදිව හා ප්‍රමාදයකින් තොරව සිදු කර ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන මෙන් කාරුණිකව දන්වා සිටිමි.



නීල් හපුහින්න
අධ්‍යක්ෂ ජනරාල්